31 JAN 2023

# කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය

## නඩු අංක 80303/01/22

## සහතික පිටපත

Scanned with CamScanner

(2)

ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය
3 JAN 2023
කොළඹ 12

**කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේදීය.**

ස්ථානාධිපති,

ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශය,

කොළඹ 05.

(පැමිණිල්ල)

<u>නඩු අංකය- B/80303/08/22</u>

එරෙහිව

01. වසන්ත මුදලිගේ
02. ගල්වැව සිරිධම්ම

(සැකකරු)

Scanned with CamScanner

ඒ අනුව මෙම අවස්ථාවේදී මෙම පළමු සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අදාළ වන තැනැත්තෙකු බවට ප්‍රමාණවත් කරුණු (සාක්ෂි) ඉදිරිපත් වී නොතිබීමත් සහ ඔහු විසින් එම පනත යටතේ වරදක් සිදු කර ඇති බව අනාවරණය නොවීමත් මත ඔහුව තවදුරටත් බන්ධනාගාරයේ තැබීම සඳහා වන කිසිදු කරුණක් මා වෙත ඉදිරිපත් වී නොමැති බවත් පෙනී යයි.අනුව මෙම පලමු සැකකරු වන මුදලිගේ වසන්ත කුමාර මුදලිගේ යන අය මෙම නඩුවෙන් නිදහස් කිරීමට තීරණය කරමි.

31 JAN 2023

අත්/කලේ,

**ප්‍රසන්න අල්විස්,**

**කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්,**

**ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය**

**කොළඹ.**

**2023.01.31**

**පිටු අංක 01 සිට පිටු අංක දක්වා දැක්වෙන්නේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 80303/01/22 දරණ නඩුවේ 2023.01.31 දින නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.**

**සැකසීම -**

**සැසඳීම-**

**රිසිට්පත් අංකය -** S/25 054861 23|01|31

**රෙජිස්ට්‍රාර්**

ප්‍රධාන රෙජිස්ට්‍රාර්
ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය
කොළඹ 12



Scanned with CamScanner

## කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේදීය,

## කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් මැතිතුමා ඉදිරිපිටදීය.

මහේස්ත්‍රාත් 31 JAN 2023

නඩු අංකය: බී.80303/01/22 දිනය: 2023.01.31

## නි යෝ ග ය

මෙම නඩුවේ පළමු සැකකරුවන මුදලිගේ වසන්ත කුමාර මුදලිගේ යන අය 2022/08/18 වන දිනද දෙවන සැකකරු වන ගල්වැව සිරිධම්ම හිමි 2022/08/19 වන දිනද අත්අඩංගුවට ගෙන 2022/08/21 වන දින සිට ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශය මගින් විමර්ශන පැවැත්වීමෙන් අනතුරුව ඔවුන්ට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (අ), (ඇ), (ඉ), (ඌ), (එ) , 3 (අ), (ආ) වගන්ති යටතේ වන වරදවල් අනාවරනය වී ඇති බවට ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රසන්න ද අල්විස් මහතාගේ 2022/11/17 දිනැති බී වාර්තාවක් සමග එදින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු අංක 8 අධිකරණයේ අතිරේක මහේස්ත්‍රාත්තුමිය විසින් බන්ධනාගතකර ඇත.

ඉන් අනතුරුව 2022/11/23 වන දින නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඇතුළු රජයේ අධි නීතිඥවරුන් දෙවන සැකකරුව අත්අඩංගුවෙන් මුදා හැරීමට නීතිපතිතුමා එකග බවට දැන්වීමෙන් අනතුරුව දෙවන සැකකාර හිමි ඇප මත මුදා හැර ඇත.

2022/12/12 වන දින පලමු සැකකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා පළවන සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත



Scanned with CamScanner

අදාල නොවන බවට කරුණු දැක්වීමට දින ලබා ගැනීමෙන් පසු ඒ සඳහා 2022/12/13 වන දිනට නියම කර ඇත.

2022/12/13 වන දින ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා සැලකිරීම් ඉදිරිපත් කරමින් ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ රිමාන්ඩ් භාරයට පත් කළ යුතු වන්නේ එම පනත යටතේ නිශ්චිත වරදක් අනාවරණය වී ඇති අවස්ථාවක දී පමණක් බවත් මෙම අවස්ථාවේ දී නිශ්චිත වරද ඉදිරිපත් කිරීමේ වගකීම පැමිණිල්ල සතු වන බවත් මුල් බී වාර්තාව මගින් පනතේ 2,3,5 වගන්ති යටතේ වන වරදවල් අනාවරණය වී නොමැති බවත් ඒ අනුව පනතේ 7 (2) වගන්තිය අනුව කටයුතු කිරීම සඳහා අධිකරණය සෑහීමටකට පත් කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවත් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත පුද්ගලයින්ගේ නිදහස සීමා කරනු ලබන සුවිශේෂී පනතක් වන බැවින් පුද්ගලයින්ගේ නිදහස සීමා කරන පනතක් අර්ථ නිරූපණය කළ යුත්තේ ඉතා ප්‍රවේශමින් බවත් පුද්ගලයින්ගේ නිදහස් ආරක්ෂා වන අයුරින් කටයුතු කළ යුතු වන බවත් මෙම මුල් බී වාර්තාව මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ නිශ්චිත වරදක් අනාවරණය නොවන හේතුව මත 7 (2) වගන්තිය යටතේ කටයුතු කිරීමට ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අධිකරණ බලයක් ඇති බවත් 7 (2) වගන්තිය යටතේ තවදුරටත් රිමාන්ඩ් භාරයට පත් නොකරන ලෙසත් පලවන සැකකරු සම්බන්ධයෙන් 7 (2) වගන්තිය යටතේ කටයුතු නොකර සුදුසු නියෝගයක් නිකුත් කරන ලෙසයි.

පිළිතුරු සැලකිරීම් ඉදිරිපත් කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් දිලීප පීරිස් මහතා දක්වා සිටියේ ස්ථානයන් කීපයක් ආශ්‍රිතව සිදුකරන ලද විරෝධතාවයන්වලදී කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුවෙන් ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 සහ 3 වගන්ති යටතේ වරදවල් අනාවරණය වී ඇති බවත් විමර්ශන කටයුතුවලින් 60% ක ප්‍රමාණයක් අවසන් වී ඇති බවත් 40% ක් ප්‍රමාණයක් සිදු කිරීමට ඉතිරිව ඇති බවත් මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සරලව කිරීමට අපහසු බවත් විශාල මූල්‍ය බලයක් සංසරණය වී ඇති බවයි.

ඉන් අනතුරුව 2023/01/17 දිනට මෙම නඩුව කැඳවීම සඳහා නියම කිරීමෙන් පසු සාක්ෂි සම්පිණ්ඩන වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර අංක 8 අධිකරණයේ අතිරේක මහේස්ත්‍රාත්තුමිය ඉදිරියේ මෙම නඩු කටයුත්ත තවදුරටත් පවත්වාගෙන යාම සුදුසු නොවන



Scanned with CamScanner

බවට රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඉල්ලීමක් සිදු කිරීමෙන් අනතුරුව සැකකරුවන් වෙනුවෙන් ඒ සඳහා විරෝධතාවය පළ කර තිබුණද අතිරේක මහේස්ත්‍රාත්තුමිය විසින් මෙම නඩු කටයුත්ත මා වෙත යොමු කරන ලදී. ඉන් අනතුරුව දෙපාර්ශවයම මින් ඉදිරියට මෙම නඩුව මා ඉදිරියේ කැඳවීමට එකඟතාවය පළ කළ බැවින් මා ඉදිරියේ ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව පලවන සැකකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් දෙපාර්ශවයටම ලිඛිත දේශන ගොනු කිරීම සඳහා 2023/01/24 දිනටත් නියෝගය සඳහා 2023/01/31 දිනටත් නියම කරන ලදී.

31 JAN 2023
කොළඹ 12

ඒ අනුව දෙපාර්ශවය විසින්ම කාර්යාලයට ලිඛිත දේශන ඉදිරිපත් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් දිලීප පීරිස් මහතා ලිඛිත සැළකිරීම ඉදිරිපත් කරමින් ඒ මගින් පහත සඳහන් කරුණු අධිකරණය වෙත සැළකර ඇති අතර මෙම පළමු සැකකරු ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (අ), (ඇ), (ඉ), (ඌ), (එ) සහ 3 (අ), (ආ) යටතේ වන වැරදි එකක් හෝ කිහිපයක් සිදුකර ඇති බව බැලූ බැල්මට පෙනෙන බවත් පලවන සැකකරු අත්අඩංගුවට ගැනු ලැබුයේ එක් සිද්ධියක් සඳහා පමණක් නොව සිද්ධීන් 7 කට අදාලව දේශීය හා ජාත්‍යන්තර කණ්ඩායම්වලින් ආධාර ලැබී රට අස්ථාවර අරාජික තත්ත්වයකට පත්කර තමුන්ට සිතැගි පිරිස් පාලනයට ගෙන ඒමට සැකකරු කටයුතු කළේ දැයි විමර්ශනය කරන බව දැනුම් දෙන බවත් පලවන සැකකරුගේ කණ්ඩායමේ ක්‍රියා කලාපය හේතුවෙන් ජනාධිපතිවරයා පවා රටින් පලා ගිය බවත් ආරක්ෂක නිලධාරීන් ද බිය ගන්වා රාජ්‍ය දේපළ අත්පත් කරගෙන ඒවාට අනර්ථය සිදුකර ත්‍රස්තවාදී කටයුතු සිදුකර ඇති බවත් පලවන සැකකරු විරෝධතා ව්‍යාපාර සඳහා පුද්ගලයින් ගෙනඒම සඳහා ගැමුණු විජේරත්න නමැති සාක්ෂිකරුට මුදල් අවශ්‍ය තරම් ගෙවිය හැකි බවත් පුද්ගලයින් ප්‍රවාහනය සඳහා ලබාදෙන ලෙස දැන්වූ බවත් සහකාර පොලිස් අධිකාරීවරයකුට "උඹ දැන ගනිං, උඹ මම හොඳට දන්නවා, උඹට වැඩි කාලයක් ඉන්න දෙන්නෙ නෑ, උඹලගෙ පවුලේ අයගෙනුත් එක්ක මේ පළිය ගන්නේ, පරිස්සමෙන් හිටපන්, උඹේ ළමයින්ටත් කියපන් පාරේ යනකොට පරිස්සමින් යන්න කියලා, කකුල් කඩනවා" යනුවෙන් තර්ජනය කර ඇති බවත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු වන පළවන සැකකරු ඒ ආකාරයෙන් නීතිය හා සාමය ආරක්ෂා කරන නිලධාරීන්ට තර්ජනය කිරීම කෙතරම් බරපතළ තත්ත්වයක් ද යන්න වටහාගත හැකි බවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිශ්චිත පුද්ගලයකුට සාපරාධී බියගැන්වීමක් සිදු කිරීම බරපතල තත්ත්වයක් ද යන්න වටහා ගත හැකි බවත් එය පැහැදිලිවම වරදක් වන බවත් මරණ තර්ජනය



Scanned with CamScanner

කිරීම බරපතල වරදක් බවත් "මෝටිවේෂන් අප්පච්චි" යනුවෙන් ප්‍රචලිත සාක්ෂිකරු ද පළවන සැකකරුගේ මූලිකත්වයෙන් සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට තමා එකඟ නොවීම හේතුවෙන් එම ස්ථානයෙන් ඉවත් වූ බවත් පලවන සැකකරු වෙනුවෙන් කරන ලද ඉල්ලීම නිෂ්ප්‍රභ කරන ලෙසයි.

31 JAN 2023

පලවන සැකකරු වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කරමින් පලවන සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අදාළ වීමට තරම් කරුණු නොමැති බවත් ඒ අනුව සුදුසු නියෝග නිකුත් කරන ලෙසත් දැනටමත් සාමාන්‍ය නීතිය යටතේ නඩු පවරා ඇති බවත් තවදුරටත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබා ගැනීම බරපතළ නීති විරෝධී නිදහස සීමා කිරීමක් වන අතර එය පනත අවභාවිතා කිරීමක් වන බවත් අවස්ථානුගත කරුණු යටතේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ඉවත්කර පලවන සැකකරුට ඇප නියම කරන ලෙසයි.

ඒ අනුව මෙම අවස්ථාවේ දී මා විසින් තීරණය කළ යුතු වන්නේ මෙම පලවන සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අදාළ වන්නේ ද යන්න එනම් පළවන සැකකරුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමට තරම් කරුණු උද්ගතව තිබේ ද යන්නයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත විශේෂයෙන් ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා සම්මත කරගත් විශේෂ පනතක් වන අතර සාමාන්‍ය නීතියෙහි ඇති වැරදි සඳහා දැඩි දඬුවම් දීම සහ ත්‍රස්තවාදීන්ට අදාළ වැරදි වලදී සාමාන්‍ය විමර්ශන ක්‍රියාවලියෙන් වෙනස්, විශේෂිත විමර්ශන ක්‍රියාවලියක් හඳුන්වාදීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හඳුන්වා දීමේ අරමුණ වී ඇත.

මුලින්ම මා විසින් සලකා බලනු ලබන්නේ ඒ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හඳුන්වා දීමේ අරමුණ, එය හඳුන්වා දීමේ දී ව්‍යවස්ථාදායකය බලාපොරොත්තු වූ කරුණු, එම පනත කුමන අවස්ථාවල කුමන පුද්ගලයන්ට අදාල කරගත යුතුද යන්න පිළිබඳවයි. ත්‍රස්තවාදය යන්නට ලබා දී ඇති අර්ථ නිරූපණයන් ද සමඟ සසඳා බලමින් පලවන සැකකරුට එරෙහිව මෙතෙක් ඉදිරිපත් වී ඇති කරුණු අනුව පලවන සැකකරු



Scanned with CamScanner

සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අදාළ කරගත හැකිද යන්න පිළිබඳව මෙම නියෝගයේදී සලකා බැලිය යුතුව ඇත.

මෙම පළවන සැකකරු 2022/11/17 වන දින සිට රිමාන්ඩ් භාරයේ සිටින [illegible] සහ විමර්ශන කොට්ඨාශය සාක්ෂිකරුවන් 150 දෙනකුගෙන් පමණ ප්‍රකාශ සටහන් කර ඇති බව දන්වා තිබුණද සාක්ෂිකරුවන් හතළිස් එක් දෙනකුගේ ප්‍රකාශ ඇතුළත් සාක්ෂි සම්පිණ්ඩන වාර්තාවක්ද 2023/01/17 වන දින ගොනු කර ඇත.

ඒ අනුව සැකකරු යම් වරදක් සිදු කරන ලද්දේ නම් එම කරන ලද වරද විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතට වැටෙන්නේ ද යන්න තීරණය කිරීමේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට විශේෂයෙන් වැටෙන වැරදි මොනවාදැයි තීරණය කළ යුතුව ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ඇති සුවිශේෂ ලක්ෂණය වන්නේ ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදියා යන්න අර්ථ නිරූපණය කර නොමැතිවීමයි. පනතේ පලවන කොටසේ ඇති සියලු වරදවල් සාමාන්‍ය නීතිය යටතේ වරදවල් වන අතර එම යම් වරදක් සාමාන්‍ය පුද්ගලයකු විසින් සිදු කළ විට ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ චෝදනා නගන්නේ කුමන නිර්ණායක මත ද යන්න කිසිදු ස්ථානයක සඳහන් නොවන අතර ත්‍රස්තවාදියා සහ ත්‍රස්තවාදී ක්‍රියාව යන්න මෙරට දී අර්ථ නිරූපණය කරමින් ලබා දෙන ලද නඩු තීන්දුවක් ද සොයාගැනීම අපහසු වී ඇත.

ඒ සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදනයන්ද නිහඬබව පෙනී යයි. ඒ අනුව කුමන පුද්ගලයකුට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන වැරදි අදාළ වන්නේ ද යන්න තීරණය කිරීමේදී මෙරට නීතියේ කිසියම් ස්ථානයක ත්‍රස්තවාදය යන්න අර්ථ නිරූපණය කර ඇති ආකාරය සහ පනත පැනවීමේ අරමුණ ආදී සියල්ල සලකා බලා තීරණය කළ යුතු වේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ පලවන කොටසේ දක්වා ඇති වැරදි සාමාන්‍ය නීතිය යටතේ වැරදි බව පෙනී යන අතර ඒවා දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් වන අතර ඒ සඳහා වූ විශේෂ නීතියක් පනවනු ලැබුයේ කවර අරමුණකින්



Scanned with CamScanner

ද යන්න සලකා බැලිය යුතුව ඇත. ඒ අනුව පනත පැනවීමේදී ව්‍යවස්ථාදායකයේ තිබූ අරමුණු සලකා බැලීමේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ 1979/07/19 වන දින හැන්සාඩ් වාර්තාව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

31 JAN 2025

එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එවකට අධිකරණ අමාත්‍යවරයා වූ කේ.ඩබ්ලිව්. දේවනායගම් මහතා විසින් පනත ගෙන ඒමේ අරමුණ පහත ආකාරයට විස්තර කර ඇත.

> " but in general it is a crime against society because, whatever may be the motive, one thing is common, they violate all laws of God and man.
>
> Their prime motive is to terrorize people with personal injury or threat or fear of death to achieve their objective. This has been identified for some time in the Northern Peninsula and investigations have proved that there is an organization behind these activities."

තවදුරටත් එම හැන්සාඩ් වාර්තාවේ 1439 වන පිටුවේ පහත පරිදි දක්වා ඇත.

> " Provisions of the Bill, it is in nine Parts. Part 1 of the Bill deals with offences <u>which are not new to the laws of this country</u>. <u>They are offences that already exist in the law. But under the special circumstances in which we are dealing with terrorists and the attendant consequences, this comes within the ambit of the special law where the punishment is enhanced."</u>

ඒ අනුව එහි පැහැදිලිව දක්වා ඇත්තේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ (i) කොටසේ දැක්වෙන වැරදි දැනටමත් පවතින නීතිය අනුව වැරදි බවත් ඒවා

ත්‍රස්තවාදීන් විසින් සිදු කළ විට ඒ වැරදි සඳහා වන දඬුවම වැඩි කිරීම සඳහා මෙම විශේෂිත පනත ගෙන එන ලද බවත්ය.

තවදුරටත් අධිකරණ අමාත්‍යවරයා පනත හඳුන්වා දීමේදී පනතේ (ii) සහ (iii) කොටස් හඳුන්වා දීම සම්බන්ධයෙන් ඔහු පාර්ලිමේන්තුවට විස්තර කරන අතර, එහිදී පැහැදිලිව විස්තර කර ඇත්තේ, ත්‍රස්තවාදීන් විසින් කරනු ලබන අපරාධ වල ස්වභාවය අනුව ඒවා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා සාමාන්‍ය නඩු කාර්ය පටිපාටිය ප්‍රමාණවත් නොවන බැවින් විමර්ශන නිලධාරීන්ට සුවිශේෂී බලතල ලබා දෙමින් මෙම පනත හඳුන්වා දෙන බවයි.

එසේම මෙම පනත, ඒ වන විට වර්ධනය වෙමින් තිබූ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් මර්ධනය කිරීම සඳහා ගෙන එනු ලැබූ පනතක් බව අධිකරණ අමාත්‍යවරයා විසින් ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව ඒ අවස්ථාව වන විට පනත යොදා ගතයුත්තේ කවරෙකුට එරෙහිවද යන්න ඉතා පැහැදිලිය.

මෙම පනත පාර්ලිමේන්තුවට ගෙන ආ අවස්ථාවේ එවකට විපක්ෂයේ සිටි ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙම පනත මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි පැනවීම සම්බන්ධයෙන් විරුද්ධ වී ඇති අතර ඒ සම්බන්ධයෙන් එම මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තු විවාදයේදී කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පනත යාපනය දිස්ත්‍රික්කයට පමණක් සීමා කරන ලෙසත්, එය ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම බලපාන පරිදි පැන වුවහොත් එම පනත අහිංසක පුද්ගලයන්ට එරෙහිව යොදා ගතහැකි බවත් ඒ අනුව පනතේ තිබෙන දැඩි වගන්තීන් එලෙස සාමාන්‍ය පුද්ගලයන්ට එරෙහිව යොදා ගැනීම තුලින් එම පුද්ගලයන්ගේ නිදහස සීමා වියහැකි බවත්ය.

යම් ත්‍රස්තවාදී කණ්ඩායමක් ක්‍රියාත්මක නොවන තත්ත්වයක් යටතේ තනි පුද්ගලයකුට එරෙහිව මෙම පනත යොදා ගැනීම සම්බන්ධයෙන් පනත නිශ්චිතව දක්වා නොමැති බැවින් ද ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදියා යන්න පනතේ නිශ්චිතව අර්ථනිරූපණය කර නොමැති බැවින් ද එක් එක් පුද්ගලයාට නීතිය ක්‍රියාත්මක කිරීමේදී මෙම පනත අත්තනෝමතික ලෙස පොලිසිය



Scanned with CamScanner

විසින් සමහර අවස්ථාවන්හිදී යොදා ගන්නා බව පෙනී යයි. විශේෂයෙන්ම තමාට දීර්ඝ කාලයක් රිමාන්ඩ් භාරයේ තැබිය යුතු පුද්ගලයින්ව මෙම පනත යටතේ ඉදිරිපත් කිරීමෙන් එම තැනැත්තාට නඩු විභාගය අවසන් වන තුරු ඇප ලබා ගැනීමට නොහැකි තත්වයක් උදා කිරීම මෙහිදී සමහර විමර්ශකයින් චේතනාන්විතව සිදු කරන බවද පෙනී යයි. ඒ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ගැසට් නිවේදනයක් මගින් තාවකාලිකව තහනම් කරන ලද සංවිධානයක් ලෙස නම් කරනු නොලැබූ පුද්ගලයින්ට එරෙහිව මෙම පනත යොදා ගැනීමේදී කුමන නිර්නායකයන් මත කටයුතු කළ යුතු වන්නේද යන්න සළකා බැලීමේ දී එය පනත ගෙන ඒමේ අරමුණ අනුව සිදු කළ යුතු බව මනාව පැහැදිලි වේ.

ත්‍රස්තවාදය යන්නට මෙරට දී හඳුනාගත හැකි එකම අර්ථ නිරූපණය 2019/04/22 දින මහජන ආරක්ෂක පනත යටතේ ජනාධිපති වරයා විසින් සාදන ලද 2019 අංක 1 දරණ හදිසි අවස්ථා (විධිවිධාන හා බලතල) දැක්වෙන නියෝගයෙහි හඳුනාගත හැක. එහි

"ත්‍රස්තවාදය" යන්නෙන්

(i) ජනගහනයක් බිය ගැන්වීමේ අරමුණින් යුතුව,

(ii) යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීම වැළැක්වීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් සාවද්‍ය ලෙස හෝ නීති විරෝධි ලෙස පෙළඹවීමේ අරමුණින් යුතුව

(iii) එවැනි යම් ආණ්ඩුවක් ක්‍රියා කිරීම වැළැක්වීමේ අරමුණින් යුතුව, හෝ

(iv) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රටක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරී බවට හානි සිදු කිරීමේ අරමුණින් යුතුව, "

(.......... සිදු කරනු ලබන වැරදි එහි දක්වා ඇත.)

ඒ අනුව ඉහත අර්ථ නිරූපනය ඉතා පැහැදිලි වන අතර, එම අර්ථ නිරූපනයේ "ත්‍රස්තවාදය" යන්න පැහැදිලිව අර්ථ නිරූපනය කර ඇත. තවදුරටත් එහි "ත්‍රස්තවාදය" අර්ථ නිරූපනය කරමින් ඉහත අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා කළහැකි වැරදි මොනවාද යන්න එම අති විශේෂ ගැසට් පත්‍රයේ පැහැදිලිව දක්වා ඇත.



Scanned with CamScanner

ඒ අනුව ත්‍රස්තවාදය යන්න ගැසට් නිවේදනය මගින් පැහැදිලි වන අතර ඉන් පරිබාහිර කිසිදු අවස්ථාවක මෙරට අර්ථ නිරූපණය අනුව ත්‍රස්තවාදය යන්න අර්ථ නිරූපණය කිරීමේ හැකියාවක් නොමැත. ඒ අනුව 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ පලවන කොටසේ දක්වා ඇති වැරදි සිදුකිරීම සම්බන්ධයෙන් එම පනත අදාළ කරගත හැකි වන්නේ ත්‍රස්තවාදී අරමුණකින් යුතුව එම කොටසේ දැක්වෙන වැරදි සිදු කළහොත් පමණි.

ඒ අනුව මෙම අවස්ථාවේදී මෙම පළවන සැකකරු ත්‍රස්තවාදී හිතවාදී අරමුණකින් යුතුව මෙම ක්‍රියාවන් සිදු කළ බවට හෝ පනත පැනවීමේ අරමුණෙහි සඳහන් වූ ආකාරයට ත්‍රස්තවාදී ක්‍රියාවක නිරත වූ බවට හෝ කරුණු ඉදිරිපත් වී ඇත්ද යන්න පිළිබඳව සලකා බැලීමේදී මුල් B වාර්ථාවවැඩිදුර වාර්ථා සාක්ෂි සම්පිණ්ඩන වාර්ථාව ඇතුළු වාර්ථාවල සඳහන් ප්‍රකාශ වලින් ත්‍රස්තවාදී අරමුණකින් මෙම පළමු සැකකරු කටයුතු කළ බවට පෙන්වීම සඳහා විමර්ශන නිලධාරීන් පුද්ගලයින් දෙදෙනෙකුගේ ප්‍රකාශ සම්බන්ධයෙන් විශ්වාසය තබන බව පෙනීයන අතර ඒවා නම් "මෝටිවේෂන් අප්පච්චි" නැමැති අයෙකුගේ ප්‍රකාශයකින් අරගලය සාමකාමී වූ බවත් පසු කාලීනව අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය අරගලයට සම්බන්ධ වූ බවත් පසුකාලීනව අරගලය ප්‍රචණ්ඩත්වයට පත් වූ බවත් සහ ගැමුණු විජේරත්න නැමැති අයෙකුගේ ප්‍රකාශයකින් විදේශීය ත්‍රස්ත සංවිධාන වලින් මුදල් ලැබෙන බව ප්‍රකාශ කිරීමත්වේ. ඒ අනුව එම ප්‍රකාශ තුළින් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත පළමු සැකකරුට අදාළ වන්නේ ද යන්න සළකා බලමි.

දැනට මාස ගණනාවක සිට මෙම පළමු සැකකරු රඳවා තබා ගනිමින් කරන ලද කිසිදු විමර්ශනයකදී එවැනි කිසිදු ත්‍රස්ත සංවිධානයකින් හෝ විදේශ සංවිධානයකින් ඔවුන්ට මුදල් ලැබුණු බවට කිසිදු කරුණක් අනාවරණය කරගෙන නොමැති අතර එය ගැමුණු විජේරත්න නැමැති අයගේ කිසිදු පදනමකින් තොර විමර්ශනයේදී මේ දක්වාම අනාවරණය නොවූ හා අනාවරණය කර නොගත් හුදු ප්‍රකාශයක්ම පමණක්වේ.

පළවන සැකකරු කලහකාරී සිද්ධීන්ට ක්‍රියාකාරීව සහභාගි වෙමින් එකී පහරදීමේ ක්‍රියාවන්ට, තර්ජනය කිරීමේ ක්‍රියාවන්හි නියැලුනු බවට කිසිදු කරුණක් මෙම ඉදිරිපත් වී ඇති



Scanned with CamScanner

එකම වැඩිදුර වාර්තාවක හෝ පිළිගත හැකි අයුරින් ඉදිරිපත් වී නොමැති බව පෙනී යයි. මෙම පලමු සැකකරු නායකත්වය ලබා දුන් අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය පසු කාලීනව අරගලයට සම්බන්ධවූ බවටත් අරගලය පසු කාලීනව ප්‍රචණ්ඩ වූ බවටත් මෝටිවේෂන් අප්පච්චි නමැති අය ප්‍රකාශ කළද අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය ප්‍රචණ්ඩ ලෙස හැසිරුණු බවට හෝ මෙම පලමු සැකකරු ප්‍රචණ්ඩ ලෙස හැසිරුණු බවට හෝ අන් අයට ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන ලෙස පළමු සැකකරු අණ කළ බවට හෝ ඔහු විසින් ප්‍රචණ්ඩ ක්‍රියාවලට උපදෙස් දෙමින් කටයුතු කළ බවට හෝ මෙම මෝටිවේෂන් අප්පච්චි නැමති අය ප්‍රකාශ කර නොමැති බව පෙනී යයි.

ඒ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ එකී පනත පැනවීමේදී අරමුණු කරනු ලැබූ ත්‍රස්තවාදියෙකු යන්නට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් යන්නට අර්ථ නිරූපණය කිරීම සඳහා කරුණු මේ දක්වා ඉදිරිපත් වී නොමැති බව පෙනී යයි.

මීළඟට මා විසින් සලකා බලනු ලබන්නේ මෙම වාර්තා මගින් ඉදිරිපත් කර ඇති පනතේ දෙවන වගන්තියේ සහ තුන්වන වගන්තියේ සඳහන් වරදවල් සිදුකළ බවට, එනම් නඩු පැවරීමක් සිදු කිරීම සඳහා වන සාක්ෂි අනාවරණය කරගෙන තිබේ ද යන්නයි.

මුල් බී වාර්තාව සලකා බැලීමේදී එහි කිසිදු සාක්ෂි සම්පිණ්ඩනයක් අන්තර්ගත නොවන අතර විරෝධතාවයන් 6ක් පිළිබඳව සංක්ෂිප්තයක් දක්වා ඇති අතර ඒවායින් කුමන අයෙකුට කුමන ආකාරයට අදාල වරදවල් සිදුවූයේ ද යන්න පිළිබඳව කිසිදු කරුණක් අනාවරණය නොවන ඉතා අසම්පූර්ණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවන අයුරින් ඉදිරිපත් කරන ලද බී වාර්තාවක් බව පෙනී යයි.

මීළඟට සලකා බලනු ලබන්නේ 2023/01/17 වන දින ඉදිරිපත් කරන ලද සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මඟින් එකී වරදවල් සම්බන්ධයෙන් මා වෙත කරුණු ඉදිරිපත් වී ඇද්ද යන්නයි.

මූලික වශයෙන්ම මෙම සැකකරු විසින් සිදු කරන ලද බවට සැක කරමින් ඉදිරිපත් කර ඇති 2(1) (අ) වගන්තිය යටතේ වන වරද පිළිබඳ සලකා බැලීමේදී එම වගන්තියේ දක්වා ඇත්තේ



Scanned with CamScanner

දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු 7 කට අඩු කාලයකට බන්ධනාගාරගත ගත කිරීමකින් හෝ දඬුවම් කළ හැකි ක්‍රියාවක් වන යම් නිශ්චිත තැනැත්තෙකුගේ මරණය සිදු කරන්නාවූ නිශ්චිත තැනැත්තෙකු අපහරණය කරන නැතහොත් පැහැර ගෙන යන්නා වූ වෙනත් යම් පහර දීමක් හෝ එවැනි යම් තැනැත්තකුට සිදුකරන්නාවූ වරදවල් ලෙසයමෙහිදී නිශ්චිත තැනැත්තා යන්නෙන් පනතේ අර්ථ නිරූපණ වගන්තිය මඟින් අර්ථ නිරූපණය කර ඇති අතර එහිදී නිශ්චිත තැනැත්තා වන්නේ ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට මූල් අවස්ථා අධිකරණයන්හි විනිසුරුවරුන් විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන්, පාර්ලිමේන්තු සහ පළාත් පාලන ආයතන සභිකයින්, ජනාධිපති කොමිෂන් සභා සාමාජිකයින්, ජූරි සභිකයින්, අධිකරණ නිලධරයන් ,සන්නද්ධ පොලිස් හමුදා මහජන සාමය පවත්වාගෙනයාමට සිටින හමුදාවල අයවලුන් අදහස් කරනු ලබන අතර එවැනි තැනැත්තන් මරණය සිදු කිරීමක් හෝ ඔවුන් අපහරණය කිරීමක් කළ බවවේ.

මේ පිළිබඳව සලකා බැලීමේදී ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගේට්ටුවේ ආරක්ෂාවට යොදවා සිටි පොලිස් නිලධාරියෙක් පසකට ඇදගෙන යාමක් පිළිබඳව පො.සැ 32142හේවාගමගේ සෙනවිරත්න නැමැති නිලධාරියා ප්‍රකාශ කර ඇති බව 2023/01/17 වන දින සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව ඉදිරිපත් කර ඇත. එවැනි ක්‍රියාවක් සිදුව තිබුණා නම් එය පනතේ 2(1) (අ) වගන්තිය යටතේ නිශ්චිත පුද්ගලයෙකුව අපහරණය කිරීමක් වන අතර එය 2(1) (අ) වගන්තිය යටතේ වරදක් බවට පත්වෙයි.

ඒ අනුව එම නිලධාරියාගේ මෙම ප්‍රකාශය මා සලකා බලමි. 2023/01/17 වන දින සාක්ෂි සම්පිණ්ඩන වාර්තාවේ ඉදිරිපත් කර ඇති එම නිලධාරියාගේ ප්‍රකාශයේ දක්වා ඇත්තේ රාජකාරිවල නිරතව සිටි පොලිස් නිලධාරියෙකු එම ස්ථානයෙන් පසෙකට ඇද ගෙන යනු ලැබුවේ වසන්ත මුදලිගේ ඇතුළු පිරිස විසින් බව තමා හඳුනාගත් බවත්, එය ඔහු රාත්‍රී පුවත් නරඹන විට හඳුනා ගත් බවයි. මෙම නිලධාරියාම එම සිද්ධියට අදාළව තලංගම පොලිස් ස්ථානය විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බී වාර්තාවකට අදාළව එනම් A4 දරන සැකකරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද නඩු වාර්තාවේ ප්‍රකාශ කර ඇත්තේ වසන්ත මුදලිගේ නැමැති අය එම ස්ථානයේ සිටි බවට පමණක් වන අතර ඔහු එවැනි පොලිස් නිලධාරීන් ඇදගෙන යාමේ ක්‍රියාවකට සහභාගී වූ බවට ප්‍රකාශ කර නොමැත.



Scanned with CamScanner

මෙම පළමු සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 (1) (අ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවට එම ස්ථානයේ සිටි කිසිදු සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයක් මගින් අනාවරණය නොවන අතර මෙවැනි විරෝධතාවයන් පවතින අවස්ථාවේ දී ඉතා විශාල පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් සිටින ස්ථානයක එවැන්නක් සිදුවීම වෙනත් කිසිදු නිලධාරියෙකු දැක ඒ පිළිබඳ ප්‍රකාශ කර නොමැති බව පෙනීයන අතර එවැනි ඇදගෙන යාමට ලක් වූ කිසිදු නිලධාරියෙකු තමා එවැනි ඇදගෙන යාමට ලක් වූ බවට ලබා දෙන ලද ප්‍රකාශයක් හෝ ඉදිරිපත් කර නොමැති බව පෙනී යයි. තවද කිසිදු රූපවාහිනී හෝ සමාජ මාධ්‍යයක හෝ පළමු සැකකරු එවැනි පොලිස් නිලධාරියකු ඇදගෙන යාමේ ක්‍රියාවකට සහභාගී වන බවට වන දර්ශනයක් ඇති බවට වන කිසිදු දර්ශනයක් ද ඉදිරිපත් කර නොමැත. ඒ අනුව මෙම පොලිස් සැරයන්වරයාගේ ප්‍රකාශය 2022/06/16 වන දින වන විටම සටහන් කර කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ප්‍රකාශය ලබාදීමට ප්‍රථම ඔහු මුල් අවස්ථාවේදීම ලබා දෙන ලද ප්‍රකාශයට වඩා එකිනෙකට වෙනස් පලවන සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් කළ බවට හැඟෙන අයුරින් මෙම ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට දෙන ලද ප්‍රකාශය සටහන් කර ඇති බව පෙනී යයි.

ඒ අනුව මෙම නිලධාරියා විසින් මුල් අවස්ථාවේදීම පළමු සැකකරු එවැනි නිලධාරීන් ඇදගෙන යාම පිළිබඳව ප්‍රකාශ නොකිරීමෙන්ම මෙම ප්‍රකාශය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෙම සැකකරු මාස ගණනාවක් රඳවා තබා ගැනීමෙන් අනතුරුව ඔහුව තවදුරටත් රඳවා තබා ගැනීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1) (අ) වගන්තිය යටතේ වරදක් ඔහු විසින් සිදුකර ඇති බව පෙන්වීම සඳහා නිර්මාණය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිතා කිරීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බව පැහැදිලිවම පෙනී යයි.

ඒ අනුව 2(1) (අ) වගන්තිය මෙම පලවන සැකකරු සම්බන්ධයෙන් අදාළ වන බවට මෙම කිසිදු සාක්ෂි සම්පිණ්ඩනයේ සඳහන් සාක්ෂිකරුවකුගේ ප්‍රකාශ මගින් අනාවරණය නොවන අතර ඒ අනුව 2(1) (අ) වගන්තිය මෙම පළමු සැකකරු සම්බන්ධයෙන් අදාළ නොවන බවට තීරණය කරමි.

මීළඟට සලකා බලනු ලබන්නේ 2(1) (ආ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බව අනාවරණ වන්නේද යන්නයි.



Scanned with CamScanner

2(1) (ආ) වගන්තිය මගින් දක්වා ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් අවුරුදු 7 කට නොඅඩු කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි ක්‍රියාවක් වන මේ පනත යටතේ වන වරදකට සාක්ෂිකරුවකු වන යම් තැනැත්තෙකුගේ මරණය සිදු කරන්නා වූ අපහරණය කරන්නා වූ නැතහොත් පැහැර ගන්නා වූ වෙනත් යම් පහරදීමක් හෝ එවැනි තැනැත්තෙකු ට සිදු කරන්නා වූ ක්‍රියාවන් පිළිබඳවයි. මේ පිළිබඳව අවධානය යොමු කිරීමේදී ද එවැනි ක්‍රියාවකට මෙම පළමු සැකකරු සම්බන්ධ වූ බවට එනම් ඔහු ක්‍රියාකාරීව සහභාගි වූ බවට කිසිදු සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි මගින් අනාවරණය නොවන අතර ඔහු එවැනි වරදක් සම්බන්ධයෙන් ක්‍රියාකාරීව සම්බන්ධ වූ බවට අනාවරණය නොවන බව මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සලකා බැලීමේදී පැහැදිලිවම පෙනී යයි. ඒ අනුව පනතේ 2 ( 1 ) ( ආ ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවට අනාවරණය නොවන බැවින් පනතේ 2 ( 1 ) ( ආ ) වගන්තිය මෙම පළමු සැකකරු සම්බන්ධයෙන් අදාල නොවන බවට තීරණය කරමි.

2 (1) (ඇ) වගන්තිය යටතේ වරදක් අනාවරණය වන්නේ ද යන්න පිළිබඳව මා පසුවට සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන අතර එය දීර්ඝ වශයෙන් සලකා බැලිය යුතු තත්වයක් වන බැවින් ඒ පිළිබඳව පසුව සටහන් කිරීමට තීරණය කරමි.

මීළඟට සලකා බලනු ලබන්නේ 2 (1) (ඉ) වගන්තිය යටතේ වරදක් පිළිබඳව අනාවරණය කර ඇත්ද යන්න පිළිබඳ සලකා බැලීමේදී 2(1) (ඉ) වගන්තියේ දක්වා ඇත්තේ ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක රාජ්‍ය සංස්ථාවක හෝ යම් බැංකුවක සමූපකාර සංගමය සමූපකාර සමිතියක දේපළකට හෝ වෙනත් රජයේ දේපළකට අනර්ථය සිදුකරන්නාවූ ක්‍රියාවක් කළ බවයි.

මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තා සලකා බැලීමේදී මෙම පළමු සැකකරු විරෝධතා ව්‍යාපාරයන් සඳහා සහභාගී වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති නමුත් ඔහු එවැනි දේපළවලට පහර දීමේ ක්‍රියාවන් සඳහා සෘජු හෝ වක්‍ර ආකාරයෙන් සහභාගී වූ බවට කිසිදු ඇසූ දුටු හෝ පරිවේශනීය සාක්ෂියක් ඇති බවට කිසිදු කරුණක් අනාවරණය නොවේ. විශාල පොලිස් නිලධාරීන් හා සිවිල් සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවකගේ ප්‍රකාශ සටහන් කර ඇති නමුත් එවැනි කිසිදු පොලිස් නිලධාරියකු හෝ සිවිල් සාක්ෂිකරුවකු මෙම පළමු සැකකරු එවැනි



Scanned with CamScanner

දේපල කඩාබිඳ දැමීමේ පහරදීමේ ක්‍රියාවන්හි නියැළෙමින් අනර්ථකාරී ලෙස හැසුරුණු බවට කිසිදු සාක්ෂියක් මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මගින් අනාවරණය කර නොමැති බව පෙනී යයි. ඒ අනුව 2(1) (ඉ) වගන්තිය ද පළවන සැකකරු සම්බන්ධයෙන් අදාළ නොවන බවට තීරණය කරමි.

31 JAN 2023

මීළඟට සලකා බලනු ලබන්නේ 2(1) (ඌ) වගන්තිය සම්බන්ධයෙන්යෙන් වන වරදක් මෙම බී වාර්තා හෝ වැඩිදුර වාර්තා මගින් අනාවරණය වන්නේ ද යන්නයි. මෙම වගන්තිය මගින් දක්වා ඇත්තේ කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලබන වචන මගින් සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජන මගින් හෝ අන් ආකාරයකින් සාහසික හෝ විවිධ ජනකොටස් නැතහොත් වර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික වෛරය නැතහොත් ජාතිවාදී අසංගතය නැතහොත් දූර්වේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවන් කළ බවයි. කිසිදු සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි මගින් මෙම පළමු සැකකරු වාර්ගිකයින් අතර හෝ ආගමික කණ්ඩායම් අතර ජාතිවාදය හෝ අසන්තතිය නැතහොත් දූර්වේතනික එදිරිවාදිකම් හැඟීම් ඇති වන අයුරින් එනම් ආගම්වාදී හෝ ජාතිවාදී අයුරින් කිසිදු ප්‍රකාශයක් කළ බවට හෝ ඔහු එවැනි ආකාරයෙන් ජාතීන් අතර හෝ ආගම් අතර වෛරය වපුරුවන අයුරින් කටයුතු කළ බවට කිසිදු සාක්ෂිකරුවකු ගේ සාක්ෂි මගින් අනාවරණය නොවේ. ඒ අනුව 2(1) (ඌ) වගන්තිය ද අදාළ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මගින් මා වෙත ඉදිරිපත් වී නොමැති බව පෙනී යයි.

මීළඟට සලකා බලනු ලබන්නේ 2(1) (එ) වගන්තිය මගින් දක්වා ඇති වරදක් අනාවරණය කර ඇද්ද යන්නයි. යම් මහා මාර්ගයක වීථියක පාරක වෙනත් යම් පොදු ස්ථානයක නැතහොත් යම් මහාමාර්ගයක් වීථියක් පාරක් වෙනත් පොදු ස්ථානයක් මත නැතහොත් යම් මහාමාර්ගයට වීථියක පාරකට වෙනත් පොදු ස්ථානයකට යාබදව පිහිටි යම් පුවරුවක හෝ වෙනත් යම් කිරීමකට දැක්වෙන වචන නිරූපණ හෝ අකුරු කිසිවක් නීත්‍යානුකූල බලයක් නොමැතිව මකන්න වූ විච්ඡේදනය කරන්නා වූ විරූප කරන්නා වූ වෙනත් අන්දමකින් අයථා ලෙස දෙයක් කරන්නා වූ ක්‍රියාවක් කිරීම අදහස් වේ. මෙම පළමු සැකකරු කිසිදු වීථියක හෝ මාර්ගයක ස්ථානයක කිසිදු පුවරුවක ඇති වචන මැකීමක්, විච්ඡේදනය, ඡේදනය කිරීමක්, විරූප කිරීමක් හෝ වෙනත් අන්දමකින් අයථා ලෙස යම් දෙයක් කිරීමක් කළ බවට කිසිදු සාක්ෂිකරුවකු ගේ ප්‍රකාශ මගින් අනාවරණය නොවන බව පෙනී යයි. ඔහු එවැනි ක්‍රියාවක් කළ බවට අඩු තරමින් කිසිදු කැමරා සටහනක දර්ශනයක් හෝ එවැන්නක් ඇති බවට හෝ



Scanned with CamScanner

කිසිදු කරුණක් ද අනාවරණය වී නොමැත. ඔහු එවැනි ක්‍රියාවන් සිදු කිරීම සඳහා වෙනත් අයට උපදෙස් ලබාදීමක් කළ බවට හෝ එවැනි ක්‍රියාවක් කිරීමේ දී ඔහු ඒවා වර්ධනය වන අයුරින් කටයුතු කළ බවට ද කිසිදු කරුණක් ඉදිරිපත් වී නොමැත. ඒ අනුව 2(1) (එ) වගන්තිය අදාළ කරගැනීම සඳහා වන කිසිදු සාක්ෂිකරුවකු ගේ ප්‍රකාශයක් ද මෙම කිසිදු සාක්ෂි සම්පිණ්ඩන වාර්තාවක මා වෙත ඉදිරිපත් වී නොමැති බව පෙනී යයි.

31 JAN 2023

මීළඟට සලකා බලනු ලබන්නේ 3 (1) (අ) වගන්තිය සහ 3 (1) (ආ) වගන්තිය යටතේ වරදවල් අනාවරණය වන්නේ ද යන්නයි. වරදක් කිරීමට සූදානම් වීමක් වශයෙන් ක්‍රියාවක් කරන්නාවූ වරදක් කිරීමට අනුබල දෙන්නාවූ කුමන්ත්‍රණය කරන්නාවූ අනුශාසනා කරන්නා වූ පොළඹවන්නා වූ ක්‍රියාවක් ඒ අනුව සිදු කර තිබිය යුතුව ඇත. මා ඉහතින් සාකච්ඡා කළ පරිදි මෙම පනත යටතේ වන එහි දෙවන වගන්තියේ සඳහන් කිසිදු වරදක් සිදු කිරීම සඳහා ක්‍රියාකාරීව හෝ වක්‍ර ලෙස හෝ සහභාගී වූ බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැති අවස්ථාවේදී ඔහු ඒවාට අනුබල දීම කුමන්ත්‍රණය කිරීම හෝ ඒවාට සහභාගී වීම යන කරුණු සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මගින් අනාවරණය නොවන බව පෙනී යයි.

මෙම පළමු සැකකරු මාස ගණනාවක් තිස්සේ රඳවා තබා ගනිමින් කරන ලද විමර්ශනවල ප්‍රතිඵලයක් වශයෙන් කුමන්ත්‍රණය කිරීම , අනුශාසනා කිරීම සහ අනුබල දීම සිදු කළ වෙනත් කිසිදු තැනැත්තකු අනාවරණය කර ගත් බවට කිසිදු කරුණක් මෙම වාර්තාවල අන්තර්ගත නොවේ.

තවද මෙම පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා එනම් දෙවන වගන්තිය යටතේ වරදවල් සිදු කිරීම සඳහා එකී ක්‍රියාවන් කළ බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වන අතර එවැනි ක්‍රියාවන් සඳහා ඔහු ක්‍රියාකාරීව සහභාගී වූ බවට එනම් ඔහු එකී ක්‍රියාවලියේ දී අදාළ වරදවල් වල කායික අංගය සඳහා සහ එකී මානසික අංගය සහිතව ක්‍රියා කළ බවට සාක්ෂි මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මගින් මා වෙත ඉදිරිපත් වී නොමැති බව පෙනී යන බැවින් 3(1) (අ) සහ (ආ) වගන්තිවල සඳහන් වරදවල් පිළිබඳ මා වෙත අනාවරණය වීමක් නොවන බවට තීරණය කරමි.

මීළඟට සලකා බලනු ලබන්නේ 2(1) (ඇ) වගන්තිය යටතේ වරදක් පිළිබඳව අනාවරණය වී ඇත්ද යන්නයි. මෙහිදී 2(1) (ඇ) වගන්තිය යටතේ නිශ්චිත තැනැත්තෙකුට හෝ ( ආ )



Scanned with CamScanner

ඡේදයෙහි දී සඳහන් සාක්ෂිකරුට සාපරාධී බිය ගැන්වීමක් සිදු කරන්නා වූ ක්‍රියාවක් සිදු කරන අවස්ථාවේ 2(1) (ඈ) වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලැබේ.

මෙහිදී නිශ්චිත තැනැත්තෙකු යන්න අර්ථ නිරූපණ වගන්තියේ දක්වා ඇති අතර මෙහිදී මෙම ඉදිරිපත් වී ඇති සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සලකා බැලීමේදී නිශ්චිත තැනැත්තෙකුට තර්ජනය කිරීමක් සහ ඔහුට සාපරාධී බියගැන්වීමක් සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී රොද්‍රිගු නමැති අයෙකුට පොලිස් මූලස්ථානය ඉදිරිපිට දී සිදු කරන ලද විරෝධතාවයකදී බැණ වැදීමක් සහ තර්ජනය කිරීම පිළිබඳව ඔහු විසින් සිදු කරන ලද ප්‍රකාශයක් 2023/01/17 වන දින ඉදිරිපත් කරන ලද සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත. එහි දී අදාළ රොද්‍රිගු නැමැති සහකාර පොලිස් අධිකාරිවරයාට "උඹ දැන ගනිං, උඹ මම හොඳට දන්නවා, උඹට වැඩි කාලයක් ඉන්න දෙන්නෙ නෑ, උඹලගෙ පවුලේ අයගෙනුත් එක්ක මේ පළිය ගන්නේ, පරිස්සමෙන් හිටපන්, උඹේ ළමයින්ටත් කියපන් පාරේ යනකොට පරිස්සමින් යන්න කියලා, කකුල් කඩනවා" යනුවෙන් තර්ජනය කළ බවට ප්‍රකාශ කළ බව එම ප්‍රකාශ උද්ධෘතයේ සඳහන්ව ඇත.

සහකාර පොලිස් අධිකාරිවරයෙකු යනු මෙම පනත යටතේ නිශ්චිත තැනැත්තෙකු වන අතර එවැනි නිලධාරියෙකුට සාපරාධී බිය ගැන්වීමක් සිදු කළ අවස්ථාවේදී එය පනතේ 2(1) (ඈ) වගන්තිය යටතේ වරදක් බවට පත් වේ.

නිලධාරියාගේ මෙම ප්‍රකාශය මා සෙසු ප්‍රකාශයන් හා සලකා බලමි. එම නිලධාරියාගේ ප්‍රකාශය ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ලබාදීමට පෙර එම නිලධාරියාම එම සිද්ධිය සම්බන්ධයෙන්ම කොළඹ කොටුව පොලිස් ස්ථානය මගින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කොටුව පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති විසින් ඉදිරිපත් කරන ලද බී වාර්තාවකට අදාළව ප්‍රකාශයක් ලබාදී ඇත. එම ප්‍රකාශය අඩංගු නඩු වාර්තාව A3 වශයෙන් පළමු සැකකරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අතර එහි එම ප්‍රකාශය සලකා බැලීමේදී මෙම පළමු සැකකරු එවැනි බැණ වැදීමක් සිදු කර ඔහුට සාපරාධී බිය ගැන්වීමක් සිදු කළ බවට ඔහුගේ ප්‍රකාශයේ කිසිදු සඳහනක් නොමැති බව පෙනී යයි.

ඔහුට පළමු සැකකරුගෙන් එවැනි බිය වැද්දීමක් සිදු වූවානම් ඔහු රාජ්‍ය නිවේදිත නිලධාරියෙකු වශයෙන් ප්‍රකාශ කිරීමට ලැබෙන මුල්ම අවස්ථාවේ දී එවැන්නක් ප්‍රකාශ

කිරීමකින් තොරව මෙම සැකකරු මාස ගණනක් අත්අඩංගුවේ තබා ගැනීමෙන් අනතුරුව මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාවට ඉදිරිපත් කිරීම සඳහාම 2023/01/01 වන දින මෙම ප්‍රකාශය සටහන් කර ඇති බව පෙනී යයි.

එම ප්‍රකාශය පිළිබඳව මාගේ අවධානය තවදුරටත් යොමු කිරීමේදී A3 දරණ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද බී වාර්තාවේ සෙසු පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශයන් ඇතුලත් වන අතර එකී සියලු පොලිස් නිලධාරීන් ද මෙම පළමු සැකකරු විසින් මෙවැනි බැනවැදීමක් හෝ සාපරාධී බිය ගැන්වීමක් ස.පො.අ. රොද්‍රිගෝ නිලධාරියාට හෝ වෙනත් කිසිදු නිලධාරියෙකුට කලබවට ප්‍රකාශ කිරීමක් සිදුකර නොමැති බව පෙනී යයි.

එහිදී අංක 8 වශයෙන් සඳහන් කර ඇති පොලිස් කොස්තාපල් 92366 ධනංජය නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ සුදු ටීෂර්ටය සහ සුදු කලිසමක් ඇඳ රැවුල වවා හිසේ රෙදි පටියක් බැඳ මාර්ග බාධකයේ බැරියර් ඇද දමා පොලිස් නිලධාරීන්ට තර්ජනය කළ බවයි. ඔහුගේ ප්‍රකාශයේ දීම මෙම චූදිත එම ස්ථානයේ සිටි බවට ප්‍රකාශ කරන නමුත් ඔහු එවැනි බැනවැදී බිය ගැන්වීමේ ක්‍රියාවකට සහභාගි වූ බවට ප්‍රකාශ කර නොමැත.

එම සිද්ධිය සම්බන්ධයෙන්ම පො. කො. 69844 උදයංග පෙරේරා නමැති නිලධාරියා ද කොළ හා සුදු බතික් ටීෂර්ටය හා කොට අළු පාට කොට කලිසම හැද දුඹුරු පාට සයිඩ් බෑගය දමා සිටි කෙට්ටු උස අයෙකු පොලීසියට තර්ජනය කරමින් සිටි බව ප්‍රකාශ කර ඇති නමුත් පලමු සැකකරු එවැනි තර්ජනයක් කළ බවට ප්‍රකාශ කර නැත. මෙම සාක්ෂිකරුවන් තිදෙනාම එකම සිද්ධිය සමීපයේ සිට දුටු තැනැත්තන් වේ.

ඒ අනුව මෙම සහකාර පොලිස් අධිකාරී රොද්‍රිගෝ නැමැති නිලධාරියාගේ 2023/01/01 වන දින කරන ලද ප්‍රකාශයේ මෙම පළමු සැකකරු ඔහුට තර්ජනය කිරීමක් කරමින් සාපරාධී බිය ගැන්වීමක් කළ බවට වන ප්‍රකාශය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔහුව සැකකරුවකු ලෙස ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිතා කිරීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බව මා වෙත පෙනී යන අතර ඒ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1) (ඇ) වගන්තිය යටතේ වරදක් මෙම සැකකරු විසින් කරන ලද බවට වන මෙම ස.පො.අ. රොද්‍රිගෝ නිලධාරියාගේ මෙම ප්‍රකාශය කිසිදු විශ්වාසනීයත්වයෙන් තොර පසුව නිර්මාණය කර මෙම සැකකරුව දීර්ඝකාලීනව



Scanned with CamScanner

බන්ධනාගාර ගත කිරීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බව පැහැදිලිවම පෙනී යන හෙයින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1) (ඇ) වගන්තිය යටතේ වරදක් ඒ අනුව අනාවරණය නොවන බව පෙනී යයි.

මෙම 2023.01.17 දිනැති සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව තවදුරටත් සලකා බැලීමේදී ස්ථානාධිපති කොට්ඨාශ බුද්ධි අංශය නුගේගොඩ පොලිස් පරීක්ෂක විජිතක වටවල නැමැති අයෙකු තමාට සිදු වූ දැල් වැටකට හේත්තුකර බලහත්කාරය පැමක් සහ කමිසයෙන් සහ මුඛ ආවරණයෙන් ඇද කොණ්ඩයෙන් අල්ලා ඔලුව සොලවා අවහිර කිරීමක් පිළිබඳව කළ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත.

එම ප්‍රකාශයේ ඔහු සඳහන් කර ඇත්තේ "ඔවුන් තමා සමඟ ගැටලුවක් ඇති කර ගනීවි යැයි හැඟී ගිය හෙයින් එම ස්ථානයෙන් ඉවත්ව යාමට උත්සාහ කිරීමේදී තමාව එම ස්ථානයේ සිදු දැල් වැටකට හේත්තු කර බලහත්කාරය හා අවහිර පැම කළ බවත් තමාගේ කමිසයෙන් සහ පැළඳ සිටි මුඛ ආවරණය ඇද ඇමූ බවත් කොණ්ඩයෙන් අල්ලා ඔලුව සෙලවූ බවත් එම අවස්ථාවේ ඔවුන්ට නායකත්වය දෙමින් සිටියේ වසන්ත මුදලිගේ බවත්ය."

මෙවැනි ආකාරයට මෙම නිලධාරියාට ඔහුගේ කමිසයෙන් සහ පැළඳ සිටි මුඛ ආවරණයෙන් ඇද කොණ්ඩෙන් අල්ලා ඔළුව සෙලවීමක් සිදු කරනු ලැබුවා නම් එය පනතේ 2 (1) (ඇ) වගන්තිය යටතේ වරදක් බවට පත් වේ. මෙම නිලධාරියාගේ මෙම ප්‍රකාශය සළකා බැලීමේදී සැකකරු වෙනුවෙන් A4 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලද මෙම සිද්ධිය සම්බන්ධයෙන් ම කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත තලංගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා කරුණු වාර්තා කරමින් ඉදිරිපත් කර ඇති බී වාර්තාව වැදගත් ලේඛනයක් බව පෙනී යයි.

එම බී වාර්තාවේ මෙවැනි නිලධාරියෙකුට මෙවැනි දැල් වැටකට හේත්තු කර පහර දීමක් පිළිබඳව හෝ ඔහුගේ කොණ්ඩෙන් අල්ලා ඔලුව සෙලවීමක් කළ බවට හෝ ඔහුට පහර දීමක් කළ බවට හෝ කිසිදු ප්‍රකාශයක් සිදු කර නොමැති බව පෙනී යයි.



Scanned with CamScanner

එම බී වාර්තාව 2022.06.16 වන දින එනම් සිද්ධියෙන් දින 6කට පසු ඉදිරිපත් කර ඇති අතර මෙම සාක්ෂිකරු එවැනි ප්‍රකාශයක් දින හයකට පසුව වත් තලංගම පොලීසිය වෙත හෝ වෙනත් පොලිස් ස්ථානයක් වෙත හෝ සිදුකර නොමැති බව පෙනී යයි.

මෙම A4 දරන නඩු වාර්තාව තවදුරටත් සලකා බැලීමේදී ඉන් පසුව ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාවල හෝ මෙම නිලධාරියාට දැල් වැටකට හේත්තුකර බලහත්කාරය පෑම හෝ අවහිර පෑමක් කිරීම හෝ කමිසයෙන් සහ මුඛ ආවරණයෙන් ඇද දැමීමක් හෝ කොණ්ඩෙන් අල්ලා ඔලුව සෙලවීමක් පිළිබඳව කිසිදු ප්‍රකාශයක් ඉදිරිපත් කර නොමැත. මෙම නිලධාරියාට මෙවැනි ක්‍රියාවක් සිදු කිරීම දුටු වෙනත් කිසිදු සාක්ෂිකරුවකු ද ඉදිරිපත් වී නොමැත. ඔහු කොටුවාශ බුද්ධි අංශයේ ස්ථානාධිපතිවරයා වන අවස්ථාවේ දී පොලිස් නිලධාරීන් විශාල සංඛ්‍යාවක් රැස්ව සිටින අවස්ථාවක ඔහුව හඳුනන කිසිදු අයකු එවැනි ක්‍රියාවක් විශේෂයෙන්ම නොදුටු බව විශ්වාස කළ නොහැක. ඒ අනුව මෙම නිලධාරියාට මෙම පළමු සැකකරු ඇතුළු කණ්ඩායම ඔහුට බලහත්කාරය පෑම කළ බවටත් වන ඔහුගේ මෙම ප්‍රකාශය මෙම පළමු සැකකරු මාස ගණනක් රඳවා තබා ගැනීමෙන් අනතුරුව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (ඇ) වගන්ති යටතේ වන වරදක් ඔහු විසින් සිදුකර ඇති බව පෙන්වීම සඳහා විමර්ශන නිලධාරීන් විසින්. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අවභාවිතා කිරීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශයක් බව පෙනී යයි.

මෙම 2023.01.17 වන දින සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සලකා බැලීමේදී සා.පො.අ කොළඹ මධ්‍යම iv විජයමුනි අසිත පුෂ්පාංග ද සිල්වා යන අයගේ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර එහි කොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ නිළඇඳුමෙන් ඇදගෙන යාමට උත්සාහ කර පහර දීමට උත්සාහ කළ බවත් උ.පො.ප සිල්වා සමග ඔවුන් මුදවා ගැනීමට සිල්වා නිලධාරියාට පහර දී මෙගාෆෝනයට පහරදී අලාභ සිදු කර තමාගේ ද නිල ඇඳුමින් ඇද තල්ලු කළ බවත් කොටුව ස්ථානාධිපතිගේ නිල කබායේ උරහිස් ලාංඡන සහ බොත්තම් කැඩී ගොස් හිස් වැසුම ද ගැලවී විසිවී තිබූ බවත් වසන්ත මුදලිගේ අධිකරණ නියෝගය ද නොතකමින් කලහකාරී ලෙස හැසිරෙමින් විරෝධතාකරුවන් මෙහෙයවමින් උසි ගැන්වීම සිදු කළ බවත් ප්‍රකාශ කර ඇත.



Scanned with CamScanner

මෙම ප්‍රකාශය සලකා බැලීමේදී මෙම සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සමග ඉදිරිපත් කර ඇති උ. පො.ප. සුමිත් ද සිල්වා ස්ථානාධිපති දූෂණ මර්දන වැටලීම් කොටුව පොලිස් ස්ථානය යන නිලධාරියාගේ ප්‍රකාශය වැදගත් ප්‍රකාශයක් බව පෙනී යයි.

එම නිලධාරියාගේ ප්‍රකාශයේ දී තමාට එවැනි පහරදීමක් සිදු වූ බවක් හෝ තමාගේ අත් තිබූ මෙගා ෆෝන් එකක් උදුරා ගෙන එයට අලාභහානි කිරීමක් පිළිබඳව හෝ ස.පො.අ. විජයමුණි අසිත පුෂ්පාංග ද සිල්වා නිලධාරියාගේ නිල ඇඳුමෙන් ඇද තල්ලු කිරීමක් කළ බවට හෝ ප්‍රකාශ කර නොමැත.

උ.පො.ප. සුමිත් ද සිල්වාගේ ප්‍රකාශය තවදුරටත් සලකා බැලීමේදී මෙම පළමු සැකකරු එම ස්ථානයේ සිටි සෙසු පිරිස් වටකරගත් අවස්ථාවේ පසුපසට ගියබව ප්‍රකාශ කර ඇති නමුත් මෙම සහකාර පොලිස් අධිකාරීවරයාට කිසිදු බලහත්කාරය පෑමේ ක්‍රියාවකට හෝ කොටුව පොලිස් ස්ථානාධිපතිවරයාට කිසිදු බලහත්කාරය පෑමේ ක්‍රියාවකට, සුමිත් ද සිල්වා නිලධාරියාට සාපරාධී බලහත්කාරය පෑමේ ක්‍රියාවකට හෝ සහභාගි වූ බවට ප්‍රකාශ කර නොමැත.

දෙදෙනා එකම ස්ථානයක් ආසන්නයේ එකිනෙකාට සමීපයේ සිටින්නා වූ පුද්ගලයින් වන අතර මේ අනුව ඔවුන් දෙදෙනා එකිනෙකට පරස්පර ආකාරයෙන් ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් මෙම සහකාර පොලිස් අධිකාරීවරයා මෙම නඩුව සඳහා නිර්මාණය කිරීම සඳහාම මෙම ප්‍රකාශයන් ලබාදී ඇති බව පෙනීයන අතර මේ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කිරීමේ දී සැකකරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති A2 දරණ කොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව හා වැඩිදුර වාර්තා සලකා බැලීමේදී එහි සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සම්පිණ්ඩනයේ දී කොටුව පොලිස් ස්ථානාධිපතිවරයා මෙම පළමු සැකකරු ඔහුට සාපරාධී බලහත්කාරය පෑමේ ක්‍රියාවක් කළ බවට ප්‍රකාශ කර නොමැති බව පෙනී යයි.

එම A2 දරණ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු වාර්තාවේ ද මෙවැනි සහකාර පොලිස් අධිකාරීවරයෙකුගේ නිල ඇඳුමෙන් ඇදීමක් පිළිබඳව කිසිදු කරුණක් ඉදිරිපත් වී නොමැත. ඒ අනුව මෙම සහකාර පොලිස් අධිකාරීවරයාගේ ප්‍රකාශය හා උ.පො.ප සිල්වා නැමැති නිලධාරියාගේ ප්‍රකාශ මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (ඇ) වගන්තිය යටතේ වරදක් මෙම පළමු සැකකරු විසින් සිදුකර ඇති බව අනාවරණය නොවන අතර ඒ මගින් ද අනාවරණය වී ඇත්තේ මෙම පළමු සැකකරු මෙම පනත යටතේ



Scanned with CamScanner

බන්ධනාගාර ගත කිරීම සඳහා මෙම නිලධාරියා විසින් මෙම ප්‍රකාශය පසුව නිර්මාණය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිතා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රකාශයක් වන බවයි.

ඒ අනුව මෙම පලමු සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1) (ඇ) වගන්තිය යටතේ වරදක් අනාවරණය නොවන බවට තීරණය කරමි.

5
31 JAN 2023
6

ඒ අනුව මෙම පලමු සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 හෝ 3 වගන්ති යටතේ වරදවල් අනාවරණය නොවන බවට තීරණය කරමි.

මීළඟට මා විසින් සලකා බලනු ලබන්නේ මෙවැනි බී වාර්තාවක් හෝ වැඩිදුර වාර්තා මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදවල් අනාවරණය නොවන අවස්ථාවේදී මා කවර ආකාරයකට ක්‍රියා කළ යුතුද යන්නයි.

මෙවැනි ඉතාම ප්‍රබල පනතක් යටතේ වන වරදක සැකකරුවකු ලෙස යම් අයෙකු සම්බන්ධයෙන් අ.න.වි.සං පනතේ 115 වගන්තිය යටතේ බී වාර්තාවක් ඉදිරිපත් කළ අවස්ථාවක අධිකරණය කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව උපරිමාධිකරණයන් විසින් ද මාර්ගෝපදේශ ලබා දී ඇත.

මෑතකදී තීරණය වූ **Udaya Prabath Gammanpila VS. M.D.C.P.Gunathilake and Other SCFR 207/2016** නඩුවේ දී ගරු ශ්‍රීපවන් අගවිනිසුරුතුමා පහත පරිදි මහේස්ත්‍රාත්වරයකු කටයුතු කළ යුතු ආකාරය ප්‍රකාශ කර ඇත.

" When a " B "report is filed, the magistrate has to apply his judicial mind to the said Report and give appropriate direction the police if further investigations are necessary. The magistrate shall not make orders mechanically without applying his judicial mind "



Scanned with CamScanner

ඒ අනුව බී වාර්තාවක් ඉදිරිපත් වී ඇති අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයකු සිය අධිකරණ මනස භාවිතා කරමින් එම බී වාර්තාවේ ඇති කරුණු සම්බන්ධයෙන් නියමිත මග පෙන්වීම් සිදු කරමින් කටයුතු කළ යුතු බවත් යාන්ත්‍රිකව ක්‍රියාකරමින් අධිකරණමය මනස භාවිතා නොකර කටයුතු නොකළ යුතු බවයි. ඒ අනුව මෙම ගම්මන්පිල නඩු තීන්දුව මගින් ද බී වාර්තාවක ඇති කරුණු පිළිබඳව අධිකරණමය මනස භාවිතා කරමින් අධිකරණමය ක්‍රියාවක නිරත වීම මහේස්ත්‍රාත්වරයෙකු විසින් සිදු කළ යුතු බව පැහැදිලිවම ශ්‍රේෂ්ඨාධිකරණය ද දක්වා ඇත.

තවද ඉතාම මෑතකදී තීරණය කරන ලද **Meettage Piyaseeli VS AG CPA/63/21** නඩුවේ දී ගරු අභියාචනාධිකරණ විනිසුරු මේනකා විජේසුන්දර මැතිනිය තීරණය කරනු ලැබුයේ අ.න.වි.සං. පනතේ 115 (1) වගන්තිය යටතේ වන වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී සැකකරුවකු බන්ධනාගාර ගත කිරීමට හේතුවන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වල සාරාංශයක් ඉදිරිපත් කළ යුතු බවයි.

**"Therefore it is very clear that the investigative officer must submit a synopsis of the statement recorded if any for the magistrate to ascertain any reason if any to remand the suspect"**

එහිදී එතුමිය තවදුරටත් සඳහන් කර ඇත්තේ ඉදිරිපත් කර ඇති බී වාර්තාව අදාල සාක්ෂි සාරාංශයන් අඩංගු නොවන අවස්ථාවේදී එය නීතියට අනුකූල නොවන වාර්තාවක් වන බවයි.

ඒ අනුව පෙනී යන්නේ බී වාර්තාවේ සහ වැඩිදුර වාර්තාවල වරදක් පිළිබඳව අනාවරණය නොවන අවස්ථාවක මහේස්ත්‍රාත්වරයෙකු සැකකරුවකු බන්ධනාගාර ගත කිරීමේ නියෝග නිකුත් කිරීම උපරිමාධිකරණයන් විසින්ද දිගින් දිගටම දෝෂ සහගත බව පිළිගනිමින් නියෝග නිකුත් කර ඇති බවයි.

ඒ අනුව මෙම අවස්ථාවේ දී ඉහතින් දැක්වූ පරිදි මෙම පළමු සැකකරු සම්බන්ධව ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වරදක් අනාවරණය වී නොමැති



Scanned with CamScanner

අවස්ථාවක විමර්ශකයන්ගේ ඉල්ලීම් අනුව තවදුරටත් බන්ධනාගාර ගත කළ යුතුද යන්න සලකා බලමි.

ප්‍රධාන මහේස්ත්‍රාත්
31 JAN 2023

මේ පිළිබඳව සලකා බැලීමේ දී

**Danny VS Sirinimal de Silva, Inspector of Police Station Chilaw and Others (2001) I SLR 29, Bandaranayake CJ.** යන නඩු තීන්දුවේ පහත උද්ධෘතය වැදගත් බව පෙනී යයි.

**" I must express my concerns over magistrate issuing orders of remand, mechanically simply because the police want such orders made. "**

මෙහිදී ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය දක්වා ඇත්තේ මහේස්ත්‍රාත්වරයෙකු විසින් යාන්ත්‍රිකව පොලිස් නිළධාරින්ගේ අවශ්‍යතාවය මත බන්ධනාගාර ගත කිරීමේ නියෝග නිකුත් කිරීම් අවධානයට ලක් කළ බවයි. මේ අනුව සැකකරුවන් බන්ධනාගාර ගත කිරීමේ දී අධිකරණයන් ඉතාම සුපරික්ෂාකාරීව කටයුතු කළ යුතුව ඇත.

මෙම **Danny VS Sirinimal de Silva, Inspector of Police Station Chilaw and Others** නඩුවේදී සාකච්ඡා කරන ලද **Mahanama Thilakaratne VS. Bandula Wickramasinhe (1999) I SLR 372** නඩු තීන්දුවේදී තීරණය කරණු ලැබුයේ මහේස්ත්‍රාත්වරයකු විසින් විමර්ශකයන් සහ අභිචෝදකයින්ගේ මන දොල සන්සිදීම සඳහා යමකු බන්ධනාගාර ගත කිරීමේ නියෝග නිකුත් නොකළ යුතු බවත් පුද්ගලයකු බන්ධනාගාර ගත කිරීම අධිකරණමය කාර්යයක් වන බවත් එවැනි ක්‍රියාවක දී මහේස්ත්‍රාත්වරයකු ඔහුගේ අධිකරණමය මනස එම කාර්යය සඳහා යොමු කරමින් ඔහුගේ නිදහසට ඇති අයිතිවාසිකම් සම්බන්ධයෙන් පියවර ගත යුතු බවයි.

එම නඩු තීන්දුවේ උපුටනය පහතින් දක්වමි.



Scanned with CamScanner

" Magistrate should not issue remand orders to satisfy the Sardonic pleasure of an appointed investigator or prosecutor.

Remanding person is a judicial act and such a magistrate should bring his judicial mind to bear on that matter before depriving a person of his liberty.

තවද **Dayananda VS. Weerasinhe and Others (1983) 2 SLR84** නඩු තීන්දුවේ සාකච්ඡා කරන ලද පහත උද්‍යතයේ සඳහන් තත්වය මෙම අවස්ථාවේ දී අවදානයට යොමු කළ යුතුව ඇත.

" It must be remembered that when a person is remanded he is deprived of his personal liberty during the duration remand period and a person who is remanded is entitled to know the reasons why he is so remanded. Magistrates should be move vigilant and comply with the requirements of the law when making remand orders and not act as a rubber stamps. "

පුද්ගලයකු දීර්ඝකාලීනව රිමාන්ඩ් භාරයට පත් කිරීමේදී ඔහු දීර්ස කාලීනව රිමාන්ඩ් භාරයට පත් කිරීමට හේතුව ඔහු දැනගත යුතු බවත් මහේස්ත්‍රාත්වරයකු නීතියේ අවශ්‍යතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින් බන්ධනාගාර ගත කිරීමේ නියෝගයක් නිකුත් කිරීමේදී කටයුතු කළ යුතු බවත් රබර් මුද්‍රාවක් සේ ක්‍රියා නොකළ යුතු බවයි.

තවද එමිල් රංජන් එරෙහිව නිතිපති **CA Bail 19/2008** නඩුවේ දී ද තීරණය කරනු ලැබුයේ විමර්ශන සඳහා සහය දැක්වීම වශයෙන් පෙත්සම්කරු රක්ෂිත භාරයට පත් කරනා ලෙස ඉදිරිපත්ව ඇති කරුණු සැලකිල්ලට ගත නොහැකි කරුණක් වන බවයි.

(27)

ඒ අනුව මෙම අවස්ථාවේදී මෙම පළමු සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අදාළ වන තැනැත්තෙකු බවට ප්‍රමාණවත් කරුණු (සාක්ෂි) ඉදිරිපත් වී නොතිබීමත් සහ ඔහු විසින් එම පනත යටතේ වරදක් සිදු කර ඇති බව අනාවරණය නොවීමත් මත ඔහුව තවදුරටත් බන්ධනාගාරයේ තැබීම සඳහා වන කිසිදු කරුණක් මා වෙත ඉදිරිපත් වී නොමැති බවත් පෙනී යයි.අනුව මෙම පලමු සැකකරු වන මුදලිගේ වසන්ත කුමාර මුදලිගේ යන අය මෙම නඩුවෙන් නිදහස් කිරීමට තීරණය කරමි.

31 JAN 2023

අත්/කලේ,

**ප්‍රසන්න අල්විස්,**

**කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්,**

**ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය**

**කොළඹ.**

**2023.01.31**

**පිටු අංක 01 සිට පිටු අංක දක්වා දැක්වෙන්නේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 80303/01/22 දරණ නඩුවේ 2023.01.31 දින නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.**

**සැකසීම -**

**සැසඳීම-**

**රිසිට්පත් අංකය -** S/25 054 861 23|01|31

රෙජිස්ට්‍රාර්

ප්‍රධාන රෙජිස්ට්‍රාර්
ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය
කොළඹ 12



Scanned with CamScanner